සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 7 ශ්‍රේණිය - 2019

# Third Term Test - Grade 7 - 2019

නම : ..............................................  නර්තනය  කාලය : පැය 02 යි.

වැදගත් :

- සියලු ම ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර සපයන්න.

## I කොටස

- **අංක 01-05 දක්වා ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(1) පා සරඹ හඳුන්වන වෙනත් නාමයක් වනුයේ,

1. දණ්ඩි සරඹ  2. ඉලංගම් සරඹ
3. අත් සරඹ  4. ගොඩ සරඹ

(2) කොහොඹා කංකාරි ශාන්ති කර්මය පළමුවෙන් ම කළේ කුමන රජකෙනෙක් සඳහා ද?

1. සේරමාන් රජු  2. මලය රජු
3. පඬුවස් දෙව් රජු  4. විජය රජු

(3) දෙවියන් යහනට වැඩමවීමට ගායනා කරනු ලබන කවි විශේෂයක් වනුයේ,

1. කෝල්මුර කවි  2. මල් යහන් කවි
3. සිරසපාද කවි  4. ග්‍රහ පංති කවි

(4) කතරගම දේවාල පෙරහැරෙහි දක්නට ලැබෙන නිර්මාණ නැටුම් කිහිපයකි.

1. තාලම්, ලී, කුළු  2. සවරං, චාමර, මොණර නැටුම්
3. ගොයම්, චාමර, කඩු නැටුම්  4. සිංහ නැටුම, හනුමන්තා නැටුම, මොණර නැටුම

(5) ''වෙසක් කැකුළු අතු අග ඉද නටන විලාසේ'' යන ගීතයේ පද රචනය කරනු ලැබුවේ.

1. නීතිඥ ජෝන්ද සිල්වා ශූරීන් විසිනි.  2. මර්සලින් ජයකොඩි පියතුමා විසිනි.
3. සුනිල් ශාන්ත මහතා විසිනි.  4. බී. ඇස්. පෙරේරා මහතා විසිනි.

- **ප්‍රශ්න අංක 06 -10 දක්වා ඇති ප්‍රශ්නවලට වරහන් තුළ දී ඇති ඉතා නිවැරදි පිළිතුර තෝරා හිස්තැන් පුරවන්න. (උත්සාහය, නෛඅඩි මේලම්, වත බැඳීම, උඩරට, විතතාතත)**

(6) ..................................... සංගීතය කරගම් නැටුමේ දී සුවිශේෂී වේ.

(7) කතරගම පෙරහැර පටන් ගැනීමේ දී .................................... නම් චාරිත්‍රයක් සිදු වේ.

(8) ..................................... නමැති භාවයෙන් වීර රසය මතු වේ.

(9) පංචතූර්ය වර්ගීකරණයේ දී දවුල .............................. ඝනයට අයත් වේ.

(10) ජේ. ඊ. සේදරමන් මහතා............................................................ නර්තන ශිල්පියෙකි.

- **අංක 11-15 දක්වා ප්‍රශ්නවලට හරිනම් ( ▶ ) ලකුණ ද වැරදි නම් ( ▲ ) ලකුණ ද යොදන්න.**

11. රද්දල්ලේ පොඩිමහත්තයා පරංගියා වත්තේ පොඩි මහත්තයා යන නමින් ද හැඳින්වේ. (..............)

12. අඹ විදමන යනු කොහොඹා කංකාරියේ නාට්‍යමය පෙළපාළියකි. (..............)

13. මාත්‍රා 2+4 තාලයට තුරඟා වන්නම නටනු ලබයි. (..............)

14. උඩරට නර්තන සම්ප්‍රදායේ ගොඩ සරඹ පහතරට නර්තන සම්ප්‍රදායේ ඉලංගම් සරඹ ලෙස හැඳින්වේ. (..............)

15. තාලම්පටින් නිකුත්වන ශබ්ද තිත් සහ තෙයි යනුවෙන් කොටස් 2කි. (..............)

- **අංක 16 - 20 දක්වා ප්‍රශ්නවලට A තීරුවේ ගැළපෙන පිළිතුර B තීරුවෙන් තෝරා යා කරන්න.**

| | A | B |
|---|---|---|
| 16. | හත් අඩියේ පියුම | එම්. එච්. ගෝමිස් මහතා |
| 17. | ආලත්ති අම්මලා | පහතරට |
| 18. | ගිනි සිසිල | ගොප්කොළ සැරසිලි |
| 19. | දොළහ දෙවියන් | අලංකාර මාත්‍රා |
| 20. | උඩ පැනීම, කැරකීම | කතරගම දේවාල පෙරහැර |

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වන අතර පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.**

(01) ඔබ ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදාය ඇසුරින් පහත සඳහන් ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

1. ඔබ ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදාය නම් කරන්න. (ලකුණු 02)
2. එහි ප්‍රධාන ශාන්තිකර්මය නම් කරන්න. (ලකුණු 02)
3. එහි ප්‍රධාන වාදන භාණ්ඩය සෑදීම සඳහා ගන්නා අමු ද්‍රව්‍ය 2ක් නම් කරන්න. (ලකුණු 02)
4. එම සම්ප්‍රදායට අයත් ප්‍රධාන සරඹ වර්ග දෙක නම් කරන්න. (ලකුණු 02)
5. ඔබ ඉගෙන ගත් වන්නමක් නම් කර එහි තාල රූපය නම් කරන්න. (ලකුණු 02)

(02) වාර්ෂිකව පැවැත්වෙන කතරගම දේවාල පෙරහැර විවිධ කලාංගවල සෞන්දර්යාත්මක වටිනාකම් විදහා දක්වන්නකි.

(1) කතරගම දේවාල පෙරහැර සම්බන්ධ ජනවර්ග දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(2) පෙරහැර ආරම්භ වන නැකත නම් කරන්න. (ලකුණු 02)

(3) නිලධාරීන් ඉදිරියේ පැවැත්වෙන හේවිසි වාදනයේ දී වාදනය කෙරෙන විශේෂ පදය නම් කරන්න. (ලකුණු 02)

(4) දෙවියන් වෙනුවෙන් දැඩි භක්තිය ප්‍රකාශ කිරීම සඳහා කෙරෙන දුෂ්කර කාර්යන් දෙකක් නම් කරන්න. (ලකුණු 04)

(03) ශ්‍රී ලාංකේය සංස්කෘතිය හා සැබැඳි සුවිශේෂ අංගයක් ලෙස ජනගායනා හැඳින්විය හැකිය.

(1) 'පුටුව සරසලයි මම සැල කරන්නේ'.... යන කවිය සම්පූර්ණ කරන්න. (ලකුණු 04)

(2) ජන ගායනාවල සුවිශේෂී ලක්ෂණ තුනක් ලියන්න. (ලකුණු 06)

(04) වෙනත් සංස්කෘතිවලට අයත් නර්තන අංග අතරින් කරගම් නැටුමට සුවිශේෂී ස්ථානයක් හිමි වේ.

(1) කරගම් නැටුමේ පුදලබන දෙවිවරු දෙදෙනෙක් නම් කරන්න. (ලකුණු 02)

(2) කරගම් නැටුම හා බැඳි සුවිශේෂී ලක්ෂණ දෙකක් නම් කරන්න. (ලකුණු 04)

(3) ඒ හා බැඳි රංග උපකරණය චිත්‍රයට නගන්න. (ලකුණු 04)

(05) පහත සඳහන් මාතෘකාවලින් දෙකක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

(1) ගැමි නැටුම්

(2) ශාන්තිකර්ම සැරසිලි

(3) ජේ. ඊ. සේදරමන් (5 x 2 = 10)

(4) ආදේශ භාණ්ඩ (ලකුණු 10)

**Answer**

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

Provincial Department of Education

## තෙවන වාර පරීක්ෂණය - 7 ශ්‍රේණිය - 2019
## Third Term Test - Grade 7 - 2019

### නර්තනය - පිළිතුරු පත්‍රය

## I කොටස

| | | | |
|---|---|---|---|
| 01. i | 06. නෛඅඩි මේලම් | 11. ◀ | 16. ගොප්කොළ සැරසිලි |
| 02. iii | 07. වත බැඳීම | 12. ▲ | 17. කතරගම දේවාල පෙරහැර |
| 03. ii | 08. උත්සාහය | 13. ▲ | 18. එම්. එච්. ගෝමිස් මහතා |
| 04. iv | 09. විතතානත | 14. ◀ | 19. පහතරට |
| 05. ii | 10. උඩරට | 15. ◀ | 20. අලංකාර මාත්‍රා (ලකුණු 1 X 20) |

## II කොටස

01. (1) උඩරට නර්තන සම්ප්‍රදාය (ලකුණු 02)
(2) කොහොඹා කංකාරිය (ලකුණු 02)
(3) දූව හෝ සම් වර්ග දෙකක් නම් කර ඇත්නම් (ලකුණු 02)
(4) පා සරඹ සහ ගොඩ සරඹ (ලකුණු 02)
(5) හනුමා, තුරඟා, වෛරොඩි යන වන්නම්වලින් එකක් නම් කර අදාළ තාලරූපය නමකර ඇත්නම්
නම් කිරීමට (ලකුණු 01)
තාල රූපයට (ලකුණු 01) (ලකුණු 02)

02. (1) සිංහල, හින්දු, මුස්ලිම් යනා දී ජනවර්ග 2ට (ලකුණු 02)
(2) පුස නැකත (ලකුණු 02)
(3) වීර පදය (ලකුණු 02)
(4) ගිනි පෑගීම, බිම පෙරලීම, කටු ගෑසීම ආදී... (ලකුණු 04)

03. (1) කවිය සම්පූර්ණ කර ඇත්නම් (ලකුණු 05)
(2) ගැළපෙන ලක්ෂණ 3ක් සඳහා (ලකුණු 05)

04. (1) මාරි අම්මාන් හා ගංගා අම්මාවරුන් (ලකුණු 02)
(2) + සමබරතාව රැක ගනිමින් නර්තනයේ යෙදීම. (ලකුණු 05)
+ කළයක් හිසමත තබාගනිමින් නර්තනයේ යෙදීම.
+ සරල චලන භාවිතයට ගෙන නර්තනයේ යෙදීම. (ලකුණු 05)
+ තනි තනිව හා යුගල වශයෙන් නර්තනයේ යෙදීම යනා දී ලක්ෂණ දෙකක් සඳහා (ලකුණු 04)
(3) මල්වලින් සරසන ලද කුඩා කළයක් ඇඳ ඇත්නම් (ලකුණු 04)

(05) මාතෘකාවට ගැළපෙන සේ ලියා ඇත්නම් එකකට ලකුණු 5 බැගින් (ලකුණු 5 x 2 = 10)

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 7 ශ්‍රේණිය - 2019

# Third Term Test - Grade 7 - 2019

## නර්තනය - ප්‍රායෝගික පරීක්ෂණය

01. (1) කැමති ගායනයක් (ලකුණු 05)
    (2) නම් කරන ලද ගායනය (ලකුණු 05)

02. (1) පා සරඹ 46 දක්වා කැමති සරඹයක් හමාරපදය සමග (ලකුණු 05)
    (2) ගොඩ සරඹ 34 දක්වා කැමති සරඹයක් කස්තිරම සමඟ

03. (1) තුරඟා වන්නමේ එක් කවිපදයක් තාල තබා ගායනා කිරීම. (ලකුණු 05)
    (2) වන්නමේ තානම කියමින් අලංකාර පදයක් නර්තන කිරීම. (ලකුණු 05)

04. (1) ඔබ කැමති ගීතයකට නර්තන නිර්මාණය වෙසක් කැකුළු/අද වෙස්සන්තර රාජපුතා (ලකුණු 10)

05. නිර්මාණයක් (චරිත නිරූපණයක්)
    සිංහයා, මොනරා, වඳුරා, අලියා (ලකුණු 10)